සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# පෙරදිග සංගීතය

6 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 - 5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන හි ලියන්න.

01 සුළඟ (වාතය) ආධාර කරගනිමින් වාදනය කළ හැකි ස්වර පුවරු සංගීත භාන්ඩය ...................................... ලෙස හැඳින්වේ.

02 සීරුවෙන් සිට අභිමානවත් ලෙස ගයනය කරනු ලබන්නේ ...................................................... ගීතයයි.

03 ඉන්දියානු ජාතික ගීතයේ නිර්මාතෘ ලෙස ................................................. මහතා හඳුන්වා දිය හැකිය.

04 ගැමියන් හා ගොපල්ලන් අතර ප්‍රචලිත .................................. සුෂිර ගණයට අයත් සංගීත භාණ්ඩයකි.

05 පාසලේ අනන්‍යතාවය එක්වරම සමාජයට විවර කළ හැකි වන සේ නිර්මාණය වී ඇති අභිමානවත් ගීතයකි, ..........................................

( පාසල් ගීය, ජාතික ගීය, විශ්වනාත් ලෞජි, රවීන්ද්‍රනාත් තාගෝර්, බටනලාව, රෙකෝඩර් ෆ්ලූට්, මවුත් ඕගන්, මෙලෝඩිකාව )

- ප්‍රශ්න අංක 6 - 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා හරිනම් (✓) ලකුණ ද , වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.

06 තාල වාදනය සඳහා නිපදවූ කොටස් දෙකකින් සමන්විත තබ්ලාව නම් වූ සංගිත භාණ්ඩය උතුරු ඉන්දීය සංගීත සම්ප්‍රදායට අයත් ය. ( )

07 'බලිවාලා' නම් ශිල්පියා ප්‍රමුඛ නැට්‍ය කණ්ඩායමක් ඉන්දියාවේ බොම්බායි සිට ලංකාවට පැමිණ, නූර්ති නාට්‍ය රඟදක්වා ඇත. ( )

08 'හොඳ දේ සිතමි' යන ගීතය, අප සංගීත කාමරයේදී ඉගෙන ගත් ළමා ගීතයකි. ( )

09 වයලින්, වියෝලා, චෙලෝ, ඩබල් බේස් යනු වයලින් පවුලේ සාමාජිකයන් වේ. ( )

10 ගායනයේදී කටහඬ ඇතිකිරීමට, හඬපාලනයට, හුස්ම ගැනීම හා පිට කිරීම ක්‍රමවත්ව සකසා ගැනීමට ශ්වසන අභ්‍යාස වල යෙදීම අත්‍යාවශ්‍ය නොවේ. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට A තීරුවේ ගැලපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.**

| | A තීරුව | B තීරුව |
|---|---|---|
| 11 | "අද වෙස්සන්තර රාජපුතා" | ශිරෝමි ප්‍රනාන්දු |
| 12 | "මම ගිම්හාන ග්‍රීස්මවූ කාලේ" | හර්ෂණ දිසානායක |
| 13 | "සුවද පද්ම ඕලු ආදි" | දුටුගැමුණු නූර්තිය |
| 14 | "ඉරෙන් හඳෙන් එළිය අරන්" | වෙස්සන්තර නූර්තිය |
| 15 | 'පොඩි කාලේ දඟ කෙරුවාම" | විදුර නූර්තිය |

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16 නර්තනය ප්‍රධාන කොට ගෙන කරනු ලබන දේශීය ගැමි ක්‍රීඩාවකි.

(i) එළුවන් කැම (ii) මේවර කෙළිය

(iii) කළගෙඩි සෙල්ලම (iv) ඔළිඳ කෙළිය

17 වාදන ඉරියව් කිහිපයක් නියමිතව ඇති සංගීත භාණ්ඩය මින් කුමක්ද?

(i) එස්රාජය (ii) සිතාරය

(iii) මැන්ඩලීනය (iv) වයලීනය

18 ගෘහස්ථ ජන ක්‍රීඩාවක් ලෙස හැඳින්විය හැක්කේ මින් කුමක්ද?

(i) මේවර කෙළිය (ii) ඔළිඳ කෙළිය

(iii) එළුවන් කැම (iv) කළගෙඩි සෙල්ලම

19 සිංහල අවුරුදු සමයේ පැවැත්වෙන සිව්පාවුන් දෙදෙනෙකු මුල්කොට ගෙන කරනු ලබන ජන ක්‍රීඩාවකි.

(i) ඔළිඳ කෙළිය (ii) එළුවන් කැම

(iii) මේවර කෙළිය (iv) කළගෙඩි සෙල්ලම

20 අළුව භාවිතා කරමින් වාදනය කරනු ලබන සංගීත භාණ්ඩ යුගලය මින් කුමක්ද?

(i) ගිටාරය, සිතාරය (ii) දිල්රුබාව, සිතාරය

(iii) මැන්ඩලීනය - වයලීනය (iv) එස්රාජය - වයලීනය

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට නිවැරදි පිළිතුරු සපයන්න.**

01 ශ්‍රී ලංකාවේ ජන ක්‍රීඩා ආශ්‍රිත ගීත ඔබ සංගීත කාමරයේ දී ගායනා කළ ආකාරය මතකයට නගා ගන්න.

(i) ඔබ ඉගෙනගත් කෙළි ගීත අතරින් කාන්තාවන් සඳහා සුවිශේෂ වූ ජන ක්‍රීඩා දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) ආභරණයක් සම්බන්ධව ගායනා කළ කෙළි ගීතයේ කොටසක් ලියන්න. (අවම වශයෙන් පාද හතරක් හෝ තිබිය යුතුය.) (ල. 2)

(iii) තානමකින් ආරම්භ වන කෙළි ගීතයේ කොටසක් ලියන්න. (අවම වශයෙන් පාද හතරක් හෝ තිබිය යුතුය.) (ල. 2)

(iv) මෙම ජන ක්‍රීඩා ප්‍රගුණ කිරීම තුළින් ඔබ තුළ වර්ධනය කරගත හැකි ගුණාංග 04 ක් ලියන්න. (ල. 4)

02 (i) ඔබ පාසලේ පාසල් ගීතය ලියා දක්වන්න. (ල. 3)

(ii) ජාතික ගීතය ගායනයේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් 02 ක් ලියන්න. (ල. 2)

(iii) පහත සඳහන් කරුණු සුදුසු පරිදි වගුවෙහි සම්පූර්ණ කරන්න. (ල. 5)

A. ගීතවල තනු හින්දුස්ථානි රාගධාරි සංගීතයේ ආභාෂය ලැබීම.

B. විවිධ ජාතීන් වාසය කරන බව හා ජාති මමත්වය.

C. එකම මේලයකින් නිර්මිත වීම.

D. රටෙහි ස්වභාව සෞන්දර්ය වර්ණනා කිරීම.

E. තාලය හා ලය භාවිතය ගීතවල බොහෝදුරට සමාන වීම.

| ඉන්දීය / ලාංකික ජාතික ගී සමානාත්මකතාවය පිළිබඳ තොරතුරු | ජාතික ගී පදමාලාවේ ප්‍රකාශිත අදහස් |
|---|---|
| | |

03 වගුවෙහි සඳහන් තොරතුරුවලට අනුව වඩාත් ගැලපෙන කරුණු තෝරා වගුව සම්පූර්ණ කරන්න. (ල. 10)

| | | |
|---|---|---|
| 1 | නාද හා ශබ්ද | |
| 2 | ශ්‍රැති | |
| 3 | භාරතීය සංගීතය | |
| 4 | රි, නි | |
| 5 | සංගීතය | |
| 6 | ස්වරාලය | |
| 7 | හින්දුස්ථානි | |
| 8 | විශ්වවිද්‍යාල | |
| 9 | ස්වර අභ්‍යාස | |
| 10 | ස්වරස්ථාපන ගීත | |

(i) ස්වර අත්‍යාවශ්‍ය වේ.

(ii) රිෂභය හා නිෂාදය ලෙස ස්වර නාම වේ.

(iii) ස්වර තන්තු

(iv) සර්පිනාව, තබ්ලාව

(v) ශාන්ති නිකේතනය, භාණ්ඩණ්ඩේ විද්‍යාපීඨ

(vi) සරිසරිග, රිගරිගම, ගම ගමප

(vii) ක්‍රම ක්‍රමයෙන් ස්වර ගායන කුසලතාවය ඇතිකර ගැනීම සඳහා ගයනු ලබයි.

(vii) අපේ කණට ඇසෙන හඬ වේ.

(ix) ගායනය මෙන්ම රංගනය ද අවශ්‍ය වේ.

(x) හින්දුස්ථානි රාගධාරි සංගීතය හා කර්ණාටක සංගීතය

04 (i) ඔබ උගත් නිර්දේශිත ළමා ගීතයක් ලියන්න. (ල. 2)


(ii) ඔබ ලියන ලද ගීතයේ පද රචනය, සංගීතය, ගායනය කවුරුන්ද යන්න ලියන්න. (ල. 3)

(iii) * ලංකාවේ නූර්ති නාට්‍ය නිර්මාණය කරන්නට මුල් වූයේ කවුරුන්ද? (ල. 1)

* නූර්ති නිෂ්පාදනයට සහාය වූ තවත් දෙදෙනෙකු නම් ලියන්න. (ල. 2)

* නූර්ති සඳහා යොදාගන්නා සංගීත භාණ්ඩ 04 ක් ලියන්න. (ල. 2)

05 (i) ස්වර පුවරුවේ සප්ත ස්වර පිහිටන අයුරු ලියන්න. (ල. 3)



(ii) සංගීත භාන්ඩ වාදනය කිරීමට සහය කරගන්නා උපකරණ තෝරා යා කරන්න. (ල. 7)





## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | මෙලෝඩිකාව | 06 | ✓ | 11 | වෙස්සන්තර නූර්තිය | 16 | iii |
| 02 | ජාතික ගීය | 07 | ✓ | 12 | විදුර නූර්තිය | 17 | iv |
| 03 | රවීන්ද්‍රනාත් තාගෝර් | 08 | X | 13 | දුටුගැමුණු නූර්තිය | 18 | ii |
| 04 | බටනලාව | 09 | ✓ | 14 | හර්ෂණ දිසානායක | 19 | ii |
| 05 | පාසල් ගීතය | 10 | X | 15 | ශිරෝමි ප්‍රනාන්දු | 20 | iv |

## II කොටස

(20 x 2 = 40)

01 (i) මේවර කෙළිය, ඔළිඳ කෙළිය, කළගෙඩි සෙල්ලම (ල. 02)

(ii) අදාළ පරිදි ලකුණු දෙන්න. (ල. 02)

(iii) අදාළ පරිදි ලකුණු දෙන්න. (ල. 02)

(iv) විනෝදය, සාමූහිකබව, එකමුතුබව, මිත්‍රත්තය ආදිය (ල. 04)

02 (i) අදාළ පරිදි ලකුණු දෙන්න. (ල. 03)

(ii) සීරුවෙන් සිට ගායනය කිරීම. / දේශයේ අභිමානය පිළිඹිබු වන පරිදි ගායනය / නිවැරදි වචන උච්ඡාරණය හා නිවැරදි ගායනය ආදිය. (ල. 02)

(iii)

| ඉන්දීය / ලාංකීක සමානාත්මතාවය | ජාතික ගී පදමාලාවේ ප්‍රකාශන අදහස් |
|---|---|
| A | B |
| C | D |
| E | |

(ල. 05)

03

| | | | |
|---|---|---|---|
| 1 | (viii) | 6 | (iii) |
| 2 | (ix) | 7 | (iv) |
| 3 | (x) | 8 | (v) |
| 4 | (ii) | 9 | (vi) |
| 5 | (i) | 10 | (vii) |

(ල. 10)

04 (i) අදාළ පරිදි ලකුණු දෙන්න. (ල. 02)

(ii) අදාළ පරිදි ලකුණු දෙන්න. (ල. 03)

(iii) සී දොන් බස්තියන්
නීතීඥ ජෝන් ද සිල්වා / නීතීඥ චාල්ස් ඩයස්
සර්පිනාව / තබ්ලාව / ඩෝලය / වයලීනය (ල. 05)

05 (i) අදාළ පරිදි ලකුණු දෙන්න. (ල. 03)

(ii) අදාළ පරිදි ලකුණු දෙන්න. (ල. 07)